## ආහාර සුරක්ෂිතතාවය හා පාරිභෝගිකයා

(සාමවිනිසුරු දේශමාන්‍ය ආචාර්ය ඩී.එම්.ටී.බී. දසනායක)

දැනට වසර 2564 කට පෙර සම්මා සම්බුදු රජාණන් වහන්සේ සනාථන ධර්මතාවයන් දෙකක් දේශනා කොට වදාළහ. ඉන් පළමුවැන්න සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායේ එකාදසක නිපාතයේ දැක්වෙන,

"කතමසම්ං එකධම්මේ: සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා" නම් වූ ප්‍රකට දේශනාවය. එහි අර්ථය වන්නේ,

" එක නම් කුමක්ද? සියළු සත්ත්වයෝ ආහාරයෙන්ම යැපෙන්නාහ "

මීට අදාළ දෙවෙනි ප්‍රකට දේශනාව ධම්ම පදයේ සුඛ වග්ගයේ මෙසේ දැක්වේ;
" ජිගච්ඡා පරමා රොගා "
ලෝ වැසියන්ට වැළඳෙන ප්‍රධානම රෝගය බඩගින්නය.

මේ අනුව මිනිසාගේ පැවැත්මට ආහාරය ප්‍රථම අවශ්‍යතාවය බවට සාක්ෂි අවශ්‍යද?

### ලෝක ප්‍රවණතාවය

බුදු දහම සිය දේශපාලන අවිය බවට පත් කර ගත් රටවල්ද ඇතුළු බොහෝ දේශයන්හි, වසර 2564 කට පසුවද යැපීමට ප්‍රමාණවත් සමබර ආහාරයක් නොලබන, නොඑසේ නම් ආහාර සුරක්ෂිතතාවයක් නොමැති ජන සංඛ්‍යාව ලෝක ජනගහනයෙන් අඩකට වැඩි බව කීම අතිශයෝක්තියක් නොවේ. විශේෂයෙන් ශ්‍රී ලංකාව ඇතුළු තුන්වන ලෝකයේ මෙම අනාරක්ෂිත භාවයට මුහුණ දෙන ජන අනුපාතය ඛේදජනක මට්ටමක පවතින බව රහසක් නොවේ. ඇති හැකි අය හොඳින් කති බොති. නැති බැරි අය සුසුම්

හෙළති. සැබැව අමිහිරි වුවද එසේය. සහශ්‍රයේ මෙම තත්වය තවත් උග්‍ර විය හැකි බව ආර්ථික විශේෂඥයින්ගේ මතය වේ.

අවම මට්ටමකින් අහේනිය පමණක් මඟ හරවා ගන්නා බහුතර පාරිභෝගිකයා විරැකියාව වැළඳගත් දරිද්‍රතාවය විසින් තව දුරටත් පීඩා විඳිනු ලබයි. මෙයට හේතු පාදක වන කාරකයන් වන්නේ;

නියඟය, ගංවතුර, යුද්ධය, සිවිල් අරගල සහ අකාර්යක්ෂම රාජ්‍ය තන්ත්‍රයයි. මේ කාරකයන් නිසා නිෂ්පාදනය අවහිරවීම, රැකියා අවස්ථා පහළ වැටීම, සියළු උපනනීන් අනවශ්‍ය ලෙස ක්ෂය වීම ආදිය හේතුවෙන් පාරිභෝගිකයාගේ හිස මත පැටවෙන වැය භාරයද තීව්‍ර වේ. දරිද්‍රතාවය වැළඳගත් හිංසනයේ බියකරු බව ජගත් සංවිධාන (UNITED NATIONS) නායකයින්ගේ පුරෝකථන පවා හැල්ලුවට හා සමච්චලයට පත් කිරීමට සමත්ව තිබේ. 1974 දී පැවැත්වූ ජගත් ආහාර සමුළුවේදී එවකට ඇමෙරිකානු විදේශ ලේකම් හෙන්රි කීසිංගර් කළ පහත දැක්වෙන පුරෝකථනය වසර 46කට පසු ද එසේ පුස්සක් බවට පත් ව තිබේ.

**“ දශකයක් තුළ කිසිම දරුවකු සාගින්නේ නින්දට නොයනු ඇත. කිසිම පවුලක් සිය ඊළඟ දිනයේ ආහාරය පිළිබඳව බියක් ඇති කර නොගනු ඇත. කිසිම පුද්ගලයෙකුගේ අනාගතය හා හැකියාව මන්ද පෝෂණය නිසා මිලින නොවනු ඇත ”**

හෙට දිනයේ කුමක් ආහාරයට ලැබේදැයි අවිනිශ්චිත භාවයෙන්ම පාරිභෝගිකයා නින්දට යාම පුරුද්දක්ව පවතී. පෙර කී සාධක ලොවම අඳුරට පත්කර පාරිභෝගිකයා බිල්ලට ගැනිම තවදුරටත් සිදුවේ.

ලෝකයේ ආහාර අවශ්‍යතාවයන් ඉදිරි වර්ෂ 40-50 තුළ දෙගුණයකින් ඉහළ යා හැකි බව 1999 දී පාරිභෝගික ජාත්‍යන්තරය පැවැත්වූ ආහාර සුරක්ෂිතභාවය පිළිබඳ

සමුළුවේදී අවධාරණය කරන ලදී. එහිදී තව දුරටත් පෙන්වා දුන්නේ ලෝක ජනගහනයෙන් මිලියන 1.3 ක් දිනකට ඇමෙරිකානු ඩොලර් එකකට අඩු මුදලකින් යැපෙන බවය.

## දිළිඳු ජනතා ඉරණම

ලෝක බැංකුවේ සංඛ්‍යා ලේඛන අනුව දිළිඳු ජනතාවගෙන් සියයට 80ක් ග්‍රාමීය වාසිකයන් වන අතර, කෘෂිකර්මයෙන් යැපෙන අය වේ. මෙයින් අඩක්ම යහපත් නොවන ප්‍රදේශවල පදිංචිව සිටින අතර, වත්මන් මූල්‍ය අර්බුද මධ්‍යයේ දිළිඳුකම වඩාත් උග්‍ර වී ඇත්තේ නාගරිකයේ හෝ නගරාසන්නයේ බව පෙන්වා දෙයි. එතෙකුදු වුවත් දිළින්දන් බහුතරය තවමත් ග්‍රාමීය පදිංචිකරුවන්ය.

## අසාර්ථක ප්‍රයත්න

ගැමි ජනතාවගේ දරිද්‍රතාවයේ සහ බඩගින්නේ මූලය අවබෝධ කර ගැන්මට නම් පිළිගැනීමට සිදුවන්නේ ලෝකයේ කිසිම රටක් කෘෂිකාර්මික ක්‍රමෝපාය වලින් ග්‍රාමීය දිළිඳුබව පිටු දැකීමට සමත් වී නැති බවය. අවශ්‍යයෙන්ම කෘෂිකර්මික නිශ්පාදන ඉහළ දැමීමෙන් එම ජන කොට්ඨාශයට යම් යහපතක් එනම් ආහාර සැපයීමේ වර්ධනයක් හා ආහාර වල නියම මිල පහළ යාමක් සිදු විය හැක. එහෙත් ප්‍රමාණවත්ව ආහාර තිබීම පමණක් නොසැහේ. එහිදී පවුලේ නිෂ්පාදනය ඉක්මවා යන ආහාර ප්‍රවේශයක් සඳහා ක්‍රය ශක්තිය තිබිය යුතුය. මෙහිදී ඒක පුද්ගල ඉඩම් අයිතියද ප්‍රමාණවත් නොවන බව පැහැදිළිය. ලෝක වෙළඳපලේ මිලට දහ ගුණයක් ඉහලින් සහල් මිල වර්ධනය කළ ජපානයට වුවද එහි සුළු ගොවියාට සමාන ආදායම් බෙදීමක් තහවුරු කළ නොහැකිවිය.

## ආහාර සුරක්ෂිතතාවය යනු කුමක්ද?

ආහාර සුරක්ෂිතතාවය යනු අවශ්‍ය පමණට ආහාර සපයා ගැනිමේ හැකියාව පමණක් නොවේ. මෙහිදී සිරුරේ වර්ධනයට අත්‍යවශ්‍ය කැලරි ප්‍රමාණය, ප්‍රෝටීන්, ක්ෂුද්‍ර

පෝෂක ඇතුළු සෞඛ්‍යාරක්ෂිත, ස්වාභාවික ආහාර ප්‍රමාණවත්ව සැපයීම අදහස් කෙරේ. එවැනි ආහාර ප්‍රමාණවත්ව සමස්ත ජනතාවට සැපයීම රාජ්‍යයක වගකීම වේ.

**<u>එක්සත් ජාතින්ගේ මාර්ගෝපදේශ</u>**

1977 සිට 1981 දක්වාම පාරිභෝගිකයාගේ ආරක්ෂාව සඳහා ජගත් සංවිධානය විවිධ ඉහළ මට්මමේ කතිකා පැවැත් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආණ්ඩු අතර දීර්ඝ සාකච්ඡා හා සංවාද වලින් පසු 1985 අප්‍රේල් 9 වන දින අනු දැන පනවන ලද පාරිභෝගික ආරක්ෂණ මාර්ගෝපදේශාවලියේ (Guidelines for Consumer Protection) ජී 39 වැනි වගන්තියෙන් ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව ආණ්ඩු විසින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ මෙසේ දක්වා තිබේ.

ආහාර : ආහාර පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරිමේදී ආණ්ඩු විසින් **<u>පාරිභෝගිකයන්ගේ ආහාර වල සුරක්ෂිතතාවය</u>** පිළිබඳව සැළකිල්ල දැක්විය යුතුය. සැකි සෑම විටම ඒ සඳහා එක්සත් ජාතින්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සහ ජගත් සෞඛ්‍ය සංවිධානයේ අප්‍යායන ලිඛිතයේ (Codex Alimentarius) හෝ එසේ නොමැතිවිට, පිළිගත් වෙනත් ජාත්‍යන්තර ආහාර ප්‍රමිතියක් අනුගමනය කළ යුතුය. වෙනත් කරුණු වලට අමතරව ආරක්ෂිත උපමාන, ආහාර ප්‍රමිති හා භෝජන අවශ්‍යතා සහ ක්‍රියාත්මක මෙහෙයුම්, පරීක්ෂණ සහ ඇගයීමේ යාන්ත්‍රණද ඇතුළුව ආහාර ආරක්ෂිත විධිවිධාන පවත්වා ගෙන යාමට, ප්‍රවර්ධනය කිරීමට හෝ වැඩි දියුණු කිරීමට ආණ්ඩු කටයුතු කළ යුතුය.

මේ විධානාත්මක මාර්ගෝපදේශ අප රටද ඇතුළු තුන්වන ලෝකයේ රටවල අනුගමනය කරන්නේ ඉතා සුළුවෙනි.

## ශ්‍රී ලංකාවේ නිති පද්ධතිය

ආහාර සුරක්ෂිතභාවයට ආනුශංගික වන යම් සෞඛ්‍ය රෙගුලාසි, ප්‍රමිති හා පිරිවිතර, නිසි කිරුම් හා මිනුම්, වෙළඳාම විධිමත් කිරිම යනාදිය පිළිඳව නීති රෙගුලාසි යටත් විජිත සමයේ සිටම මෙහි ක්‍රියාත්මක වුවද යැපීමට ප්‍රමානවත් සැපයීම සහ මිළදී ගැනීමේ ශක්තිය තහවුරු කෙරෙන නීති රෙගුලාසි මෙතෙක් සම්පාදනය වී නැත.

ආහාර සුරක්ෂිතතාවය මිනිස් සමාජයේ මූළික අවශ්‍යතාවයක් වුවද ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූළික අයිතිවාසිකම් පැනවෙන III පරිච්ඡේදයේ මේ සඳහා විධි විධාන සලස්වා නැත. සිතීමේ මෙන්ම කායික ආරක්ෂාව සඳහා විවිධ ප්‍රතිපාදන තිබුණද, ජීවිතය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කරන මූලික අයිතිය එමගින් තහවුරු කර නැත. මෙය කාලීන අවශ්‍යතාවයක් බව අමුතුවෙන් කිව යුතු නැත.

## ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරිමේ උපාය මාර්ග

ජනගහණ වර්ධනයට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය වේගවත් කර රට ආහාරයෙන් ස්වයංපෝෂිත කිරීම මේ සඳහා වන ඒකායන ප්‍රවේශය වේ. ඒ සඳහා කෘෂිකර්ම පද්ධතියේ ධාරිතාවය හා කාර්යක්ෂමතාවය වර්ධනය ප්‍රබලම සාධකය වේ. මෙහිදී ඉහළ වාරිපහසුකම් සහිත වන වගාවෙන් තොර පාංශු බාදනය වැළැක්වූ සරුබිම් උපයෝගිත්වය අත්‍යවශ්‍යය. එතෙකුදු වුවත් ශ්‍රී ලාංකාව වැනි රටවල ජාතික ආහාර සුරක්ෂිතතාවය තහවුරු කෙරෙන සියල්ලෙන් ස්වයංපෝෂිතභාවය උදා කර ගැනිම ආර්ථික හා පාරිසරික වශයෙන්ද දැරිය නොහැකි වැය භාරයක් වේ. දැනටමත් කෘෂිකාර්මික යෙදවුම් වන පොහොර, කෘමිනාශක, බීජ, උපකරණ යනාදිය සාමාන්‍ය ගොවියාට දැරිය නොහැකි මට්ටමක පැවැතීම මෙහිදි සැළකිල්ලට ගත යුතුවේ.

මෙහිදි සැළකිල්ලට ගත යුතු විශේෂිත කාරණය වන්නේ ක්‍රය ශක්තිය (Buying Power) වර්ධනය කිරිමය. සුළු පරිමාන රැකියා නියුත්තිකයන් වන බහුතරයක් පාරිභෝගිකයින් ලබන උද්ධමන පීඩිත පාරිශ්‍රමිකය පහළ දරිද්‍රතා මට්ටමටද අඩුය.

ඔවුන්ගේ පීඩනය කෙසේ දැයි කිව හොත් බොහෝ අය පවසන්නේ **<u>" අපි කනවා නොවේ ලෙව කනවා  (We do not eat, but lick) "</u>** යනුවෙනි. අප රට ඇතුළු තුන්වැනි ලෝකයේ රටවල මුදල් අගය පහත වැටීමද ආහාර අනාරක්ෂිතභාවයට බලපා තිබේ. එම තත්වය තුළ පෝෂ්‍යදායක, ප්‍රමාණවත්, අංග සම්පූර්ණ, සමබර ආහාර වේලක් අඛණ්ඩව සපයා ගැනීම ඔවුනට හීනයක් පමණි. මෙයට පිළියමක් ලෙස ඔවුන්ගේ ආර්ථික ශක්තිය වඩා වර්ධනය කිරිමේ වැඩපිළිවෙල ආණ්ඩු විසින් දියත් කළ යුතුය. මන්ද පොෂණයෙන් පෙළෙන බහුතර ජනතාවක් යම් රටක සිටී නම් ඒ රට ජීවත්වීමට යහපත් රටක් නොවේ.

අඩු වරප්‍රසාද හෝ වරප්‍රසාද නොමැති සාමාන්‍ය ජනතාව වෙත ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරිමට නම් තුලනාත්මක සංවර්ධනය දිරිගැන්වීමත් ජනතා හිතවාදි පාලන තන්ත්‍රයක අඛණ්ඩ පැවැත්මක් සහතික කිරිමත් අවශ්‍යය. මෙම ජනතාව මුහුණපාන පහත දැක්වෙන ගැටළු වලට රජය මගින් පිළියම් යෙදිය යුතුය;

1. ජනතාවගේ අසරණභාවය නිසා උද්ගත පාරම්පාරික උදාසීනත්වය හා සාධාරණ අරගල වලදී දායකත්වය නොසැපයීම හෝ සැපයීමට උනන්දු නොවීම.
2. ආර්ථික ශක්තිය (Economic Terms) අධ්‍යාපන මට්ටම් (Education Levels) හා කේවෙල් කිරීමේ බලය (Bargaining Power) සමබරතාවයක නොපැවතීම.
3. සාධාරණ හා සමාන අවස්ථා සහිත යැපීමට ප්‍රමාණවත් (Just, Equitable and Sustainable) ආර්ථික හා සංවර්ධන අවස්ථා බහුතර පාරිභෝගිතාව නොලැබීම.

## <u>පාරිභෝගික ජනතා වගකීම</u>

ලෝකයේ කිසිදු ජන කොට්ඨාශයක් ආහාර සුරක්ෂිතතාවය හෝ වෙනත් සුරක්ෂිතතාවයක් රිදී බන්දේසියක තැබූ ප්‍රදානයක් ලෙස ලබා ගෙන නැත. ඒ සඳහා සියළු දෙනාගේ අප්‍රතිහත ධෛර්යයත්, කැපවීමත්, සංවිධානාත්මක ප්‍රතිචාරත් අවශ්‍යය. අතීතයේ සිටම යම් පාරිභෝගික සුරක්ෂිතතාවයක් දිනා ගත්තේ කඳුලින්, දහදියෙන්, ලෙයින් කළ කැපවීම් තුලිනි. මේ නිසා පාරිභෝගික ජනතාව දැඩි විමසිල්ලෙන් හා සුක්ෂ්ම

පරික්ෂාවෙන්ද පහත දැක්වෙන කරුණු පිළිබඳව අවබෝධයෙන් ද සිටිය යුතු අතර, අහිත කර සාධක ජය ගැනීමට සංවිධානය විය යුතුය.

I. නිසි කළමනාකරණයෙන් හා තුලනාත්මක සමායෝජනයෙන් තොරව කෘෂි ඉඩම් පරිහරණය.

II. ආහාර නිෂ්පාදනයට යොදා ගත හැකි ගොඩ මඩ ඉඩම් වාණිජ කටයුතු හා ගොඩනැගිලි ඉදිකිරිමට පැහැර ගැනීම.

III. දිවි පැවැත්මට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ නොහැකියාව හා එහි ප්‍රතිඵල වශයෙන් කායික සහ මානසික බෙලහීනතාවය හා මරණය පවා ළඟා කළ හැකි නිෂ්පාදන ක්‍රමෝපායක් හා අපද්‍රව්‍ය ඉවක් බවක් නොමැතිව අපහරණය නිසා සිදුවන හිංසනය.

IV. අසීමිත ආක්‍රමණශීලි ප්‍රචාරණය තුළින් අහිත කර විය හැකි ආහාර පිළිබඳව පාරිභෝගික සිත් සතන් තුළ නිසගින් පැන නැගිය හැකි අවිශ්වාසය යටපත් කර හිතවාදී විශ්වාසයක් ජනිත කරවීම සඳහාත්, විශේෂයෙන් දැඩි අවශ්‍යතාවයක් නොමැති වුවද අනර්ථයක් ලබා කර දෙන්නාවූද ආහාර වර්ග සඳහා පෙළඹවීමට ගන්නා කැම උපාය මාර්ග.

V. පරිසර දූෂණය හා වන විනාශය මගින් ජල සම්පත් සිඳීයාම, වැසි එල අඩුවීම, කෘෂි ඉඩම් නිසරුවීම හා නියගය පැතිරීම මගින් ආහාර නිෂ්පාදනය පහත වැටීම.

VI. කෘෂිකර්මික අපද්‍රව්‍ය, කෘමිනාශක හා පළිබෝධ නාශක අවිධිමත් ලෙස බැහැර කිරිම මගින් ආහාර වලට වන හානි.

## සංවිධානය වීමේ වැදගත්කම

ආහාර සුරක්ෂිතතාවය අත්කර ගැනීමේ ඒකායන මාර්ගය වන්නේ අනාරක්ෂිතව සිටින සියළු දෙනාගේ එකමුතුව තුළින් ගොඩනැගිය හැකි අවධාරණාත්මක ඉල්ලීම් වේ. පෙර කී පරිදි දයාවෙන් අනුකම්පාවෙන් එය පාලකයින් විසින් සලසා දේ යැයි බලාපොරොත්තු විය නොහැකිය. දිළිඳුකම නිසාම උද්ගතව ඇති ආහාර අනාරක්ෂිතතාවය

පිළිබඳව ඩෙනිස් ගවුලට් (Denis Goulet) නැමැති ලේඛකයා ඔහුගේ " ද කෘවල් චොයිස් " (The Cruel Choice) නමැති ග්‍රන්ථයේ අන්ත දරිද්‍රතාවය හඳුන්වා ඇත්තේ මෙසේය;

" අන්ත දරිද්‍රතාවය එක්තරා කෲර නරකාදියකි. දරිද්‍රතාවය දෙස එබී බැලීමෙන් පමණක් කිසිවකුට එම නරකාදියේ කෲර බව වටහා ගත නොහැකිය. "

අවසාන වශයෙන් කිව යුත්තේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු වන්නේ දරිද්‍රතාවය දුරු කළ දාට බවය. වසර 2564 කට පෙර බුදු රජාණන් වහන්සේ චක්කවත්ති සීහනාද සූත්‍රයෙහි දැක්වෙන පරිදි දේශනා කළේ සියළු අපරාධ වලට නිධානය දිළිඳුකම බවය. එහිම කූට දන්ත සූත්‍ර දේශනාවෙන් පෙන්වා දී ඇත්තේ අපරාධ වැළැක්වීමට දඬුවම්දීම නිරර්ථක බවත්, ඒ සඳහා ජනතාවගේ ආර්ථික ශක්තිය වර්ධනය කළ යුතු බවත්ය.

අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II වන පරිච්ඡේදයෙහි ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමා තිබේ. එසේ නම් බුද්ධ භාෂිතය අනුව කටයුතු කරමින් ජනතාවට සුරක්ෂිතතාවය අත් කර දීමට ආණ්ඩු වලට බාධාවක් තිබේද යනු අපේ ප්‍රශ්නයයි.